## රසායනික පොහොරවල ප්‍රමිතිය

| | |
|---|---|
| යූරියා | - $N_2$ 46% (අවම) |
| MOP | - $K_2$ 60% (අවම) |
| TSP | - $P_2$ 46%(අවම) |
| SSP | - $P_2$ 17% (අවම) |
| ඇමෝනියම් සල්ෆේට් | - $N_2$ 20.6% (අවම) |
| සින්ක් සල්ෆේට් | - Zn 22% (අවම) |
| කිසරයිට් | - Mg 24% (අවම) |
| DAP | - $N_2$ 18% (අවම) |
| | - $P_2$ 46% (අවම) |

## පොහොරවල ගුණාත්මක භාවය තහවුරු කිරීම

- **පොහොර ආනයනය කිරීමේදී,**

1. පොහොර ඇනවුම් කරන අවස්ථාවේදී නිෂ්පාදන සහතික හා තත්ත්ව වාර්ථා මඟින් ගුණාත්මකබව තහවුරු කිරීම.
2. පොහොර තොගය ශ්‍රී ලංකාවට ගොඩබාන අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ පිළිගත් රසායනාගාර මඟින් විශ්ලේශණය කිරීම මඟින් ගුණාත්මක බව තහවුරු කිරීම.

- **පොහොර සැකසීමේදී,**

ජාතික පොහොර ලේඛම් කාර්යාලයේ අනුමත සංයුතීන්ට අනුව සකස් කළ පොහොර සෑම සැකසුම් කණ්ඩායමක දී සාම්පල ලබා ගෙන පිළිගත් රසායනාගාර මඟින් විශ්ලේශණය කිරීම.

- පොහොර බෙදාහැරීමේදී හා අලෙවියේ දී..

අහඹු සාම්පල් දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂන මගින් ලබා ගෙන පිළිගත් රසායනාගාර මඟින් විශ්ලේශනය කිරීම.



## ආයතනික ව්‍යුහය

අමාත්‍යංශ ලේකම්
↓ (පොහොර උපදේශන සභාව)
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය
↓
දිස්ත්‍රික් සහකාර අධක්ෂකවරුන්
↓
සංවර්ධන නිලධාරීන් (පොහොර)
ගොවිජන සේවා මධ්‍යස්ථාන

## දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ කාර්යය භාරය

01. පනතේ / අධ්‍යක්ෂවරයාගේ බලතල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම.
02. දිස්ත්‍රික්කය තුළ පොහොර සුලබ කිරීම.
03. පොහොරවල ගුණාත්මය පිළිබඳ අධීක්‍ෂණය
04. පොහොර කමිටු පැවැත්වීම.
05. පොහොර අක්‍රමිකතා වැළැක්වීම.
06. පොහොර සාම්පල් ලබා ගැනීම.
07. පොහොර අලෙවිසැල් අධීක්ෂණය.
08. පොහොර සම්බන්ධ පුහුණු කටයුතු සිදු කිරීම
09. පොහොර සමාගම් සහ ආයතන සම්බන්ධීකරණය
10. දි.ලේකම්තුමාගේ උපදෙස් ක්‍රියාත්මක කිරීම.
11. පොහොර සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

## රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය

**දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකු දැනට සේවය කරනු ලබයි.**

01 [illegible]
02 ස.අ. - රවීන්ද්‍ර පද්මනිල් (076 274 50 37)
ස.අ. - සිසිර විජේසුන්දර (070 295 11 89)



# ජාතික පොහොර ලේකම් කාර්යාලය හා එහි කාර්යයභාරය



සැකසුම :-
ජාතික පොහොර ලේකම් කාර්යාලය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
රත්නපුර

## හැඳින්වීම

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනතේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය ස්ථාපනය කර අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති අතර එම කාර්ය භාරය පහත දැක්වෙන අංශ යටතේ ක්‍රියාත්මකය.

- ප්‍රතිපත්ති ආයතනික සම්බන්ධීකරණ හා බලපත්‍ර අංශය
- තාක්ෂණික හා ආර්ථික විශ්ලේෂණ අංශය
- පොහොර අවශ්‍යතා හඳුනා ගැනීමේ හා බෙදාහැරීමේ අංශය
- පොහොර ආනයන තොග පාලන හා සහනාධාර පරිපාලන අංශය
- නෛතික හා විමර්ශණ අංශය
- සැලසුම් හා මෙහෙයුම් අංශය
- ආයතන හා පරිපාලන අංශය

## දැක්ම

"ශ්‍රී ලංකාවේ වගා කරන සියලු බෝග වල නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කාබනික හා අකාබනික පොහොර නියමිත ප්‍රමිතියෙන් යුතුව නියමිත වේලාවට සම්පාදනය තහවුරු වී තිබීම."

## මෙහෙවර

"පොහොර විධිමත් කිරීමේ පනතේ විධි විධාන අනුව සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විද්‍යානුකූල නිර්දේශ මත පොහොර අවශ්‍යතාවය තක්සේරු කිරීම, පොහොර ආනයනය හා තොග පාලනය, නිසි ගුණාත්මක බවින් යුතු පොහොර බෙදාහැරීම හා අලෙවිය තහවුරු කිරීම, කාබනික පොහොර හා අකාබනික පොහොර භාවිතයේ දී පරිසර හිතකාමී ලෙස පොහොර භාවිතය වැඩිදියුණු කිරීම, ගොවි ප්‍රජාවගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් යුතුව පොහොර සහනාධාර යෝජනා ක්‍රම මෙහෙයවීම හා පොහොර භාවිත ක්ෂේත්‍රයේ අක්‍රමිකතාවයන් වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම."

## අරමුණු හා කාර්යභාරය

- 1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනත විධිමත්ව ක්‍රියාත්මක කිරීම.
- පොහොර අවශ්‍යතාව නිවැරදිව හඳුනා හා නිර්දේශිත පොහොර ප්‍රමාණ හඳුනා ගැනීම.
- පොහොර ආනයනය තොග පාලනය, පොහොර අවශ්‍යතාව සපුරා දීම, තහවුරු කිරීම හා බෙදාහැරීමේ කටයුතු මෙහෙයවීම.
- පොහොරවල ප්‍රමිති තත්ත්වයන් තහවුරු කිරීම.
- ඒ ඒ බෝග සඳහා නිර්දේශිත පොහොර භාවිතය විධිමත් කිරීම.
- රජයේ පොහොර සහනාධාර වැඩසටහන විධිමත්ව ක්‍රියාත්මක කිරීම.
- පොහොර සම්බන්ධ කාර්යයන්හි නියුතු ආයතනවල කාර්යයන් විධිමත් කිරීම.
- පොහොර භාවිත ක්ෂේත්‍රයේ අනුක්‍රමිකතාවයන් වැළැක්වීම.
- පොහොර පිළිබඳ නිල තොරතුරු ප්‍රකාශයට පත් කිරීම.
- පොහොර ආනයනය, තොග පාලනය හා පොහොර බෙදාහැරීමේ කටයුතු මෙහෙයවීම.
- පොහොර ආනයනකරුවන් හා නිෂ්පාදකයන් ලියාපදිංචි කිරීම.
- පොහොර තත්ත්ව පාලනය හා නෛතික කටයුතු ක්‍රියාත්මක කිරීම.
- කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.
- ගොවින් හා ව්‍යවසායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.
- පොහොර පිළිබඳව ප්‍රකාශන මුද්‍රණය කිරීම හා බෙදාහැරීම.
- ඉහත කාර්යයන් සම්බන්ධ දත්ත මූලයන් පවත්වා ගෙන යාම හා තොරතුරු නුවමාරුව.

## පොහොර ප්‍රමිති

- ප්‍රධාන සෘජු පොහොර වර්ග වල ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කර ඇත.
- ඒ ඒ බෝග සඳහා අනුමත පොහොර මිශ්‍රණ වල සංයුතීන් ප්‍රකාශයට පත් කර ඇත.
- ඒඒබෝගවලටඅදාළකෘෂිකර්මදෙපාර්තමේන්තු පර්යේෂණ මධ්‍යස්ථාන මගින් බෝගයට අදාළ පොහොර නිර්දේශ දක්වයි.

## කාබනික පොහොරවල ප්‍රමිතිය

| | |
|---|---|
| නයිට්‍රජන් | - 01% (අවම) |
| පොස්පරස් | - 0.5% (අවම) |
| පොටෑසියම් | - 01%(අවම) |
| මැග්නීසියම් | - 0.5% (අවම) |
| ආම්ලිකතාවය | - 6.5-8.5 අතර |
| තෙතමනය | - 25% උපරිම |
| බැර ලෝහ | - ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නියමයන්ට වඩා අඩු අගයක් වීම. |
| වැලි | - 20% ට වඩා අඩු වීම. |
| ජීවී බීජ | - වර්ග මීටරයට 16 ට වඩා අඩු වීම. |
| වර්ණය | - අළු පැහැයට හුරු කළු සැල්මොනෙල්ලා හා කෝලයි බැක්ටීරියා අන්තර්ගත නොවීම. |